# ප්‍රසම්පාදන දැන්වීම - කාලය දීර්ඝ කිරීම

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
## ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම
## 2021/2022

**ලංසු යොමුව : BUSL/GAS/15/21/01**

2021.08.20 දින සිට 2021.09.30 දින දක්වා දිවයින පුරා පනවා තිබූ සංචරණ ඇදිරි නීතිය සැළකිල්ලට ගෙන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට 2021/2022 වර්ෂය සඳහා ආරක්ෂක සේවාවන් ලබා ගැනීමට විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2021.08.18 දින දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පලකළ ප්‍රසම්පාදන දැන්වීමේ කාලය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**ආරක්ෂක සේවා සපයන ආයතන**

I. ව්‍යාපාර නාම අඥාපනත යටතේ හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය යටතේ ලියාපදිංචි වී සිටින ආයතනයක් විය යුතුය.

II. අවම වශයෙන් පසුගිය වසර 03 ක රාජ්‍ය ආයතනයක/ ව්‍යාවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**(සැ.යු. ඉහත කරුණු සනාථ කිරීම අදාළ සහතිකවල, සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය)**

ලංසු ලේඛන ගාස්තුවක් නොගෙවා පරීක්ෂාකර බැලිය හැකි අතර ආපසු නොගෙවන ලබන රු. 1,500.00 ක ලංසු ලේඛන ගාස්තුවක් මෙම විශ්වවිද්‍යාලයේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවා, **2021.10.27 දින දක්වා** රාජකාරි වේලාවේ දී විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පාලන අංශයෙන් ලබාගත හැකිය. විශ්වවිද්‍යාලයට පැමිණීමට නොහැකි අයදුම්කරුවන් උක්ත ලංසු ලේඛන ගාස්තුව **මහජන බැංකුවේ අංක 008-1001-5001-4462 දරණ ශ්‍රී ලංකා භික්ෂු විද්‍යාල ගිණුමට** ගෙවා ලබාගත් ලදුපත (මුල් පිටපත) හා ඉල්ලීම් ලිපියක් **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (සාමාන්‍ය පාලන)"** නමින් පහත ලිපිනයට එවීමෙන් ලංසු ලේඛන ගෙන්වා ගත හැකිය. එහිදී සිදුවන තැපැල් ප්‍රමාදයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ වගකීමක් නොමැති බැවින් කල්වේලා ඇතිව ලංසුලේඛන ගෙන්වා ගැනීම අයදුම්කරුවන්ගේ වගකීමකි.

**ලංසුකරුවන් පහත සඳහන් කොන්දේසී තරයේ පිළිපැදිය යුතුය**

1. මිල ගණන් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළයුතු අතර **"මුල් පිටපත"** හා **"අනුපිටපත"** වශයෙන් සලකුණුකර නිසි පරිදි මුද්‍රා තබා වෙන වෙනම කවර දෙකක බහාලිය යුතුය.
2. ඉහත ලිපි කවර දෙකම එක් ලිපි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ, **"ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට ආරක්ෂක සේවා සැපයීම 2021/2022"** යන්න සහ **ලංසු භාරගන්නා අවසාන දිනය** හා **වේලාව** සටහන් කළ යුතුය.
3. විකල්ප ලංසු භාර ගනු නොලැබේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පිළිගත් බැංකුවකින් ලබා ගත් රු. 120,000.00 ක් වටිනා කොන්දේසී විරහිත ලංසු සුරක්ෂණයක්, ලංසු සමග ඉදිරිපත් කළයුතු අතර එය ලංසු භාරගන්නා අවසන් දින සිට දින 105 දක්වා වලංගු විය යුතුය. දැනට ලංසු ලේඛන මිල දී ගෙන ඇති ලංසු කරුවන් බැංකු සුරක්ෂණ ලබා ගෙන ඇත්නම් ඒවායේ කාලය මෙම දැන්වීමට අනුව දීර්ඝකර ඉදිරිපත් කළ යුතුය. **එසේ නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මුද්‍රා තබන ලද ලංසු **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව** නමින් පහත සඳහන් ලිපිනයට 2021.10.28 **දින පස්වරු** 2.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් නියමිත වේලාවට පෙර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

2021.10.28 **දින පස්වරු 2.15** ට ලංසුපත් විවෘත කිරීමට කටයුතු කරන අතර එම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලය පැවරූ නියෝජිතයින්ට සහභාගිවීමට අවසර ඇත. වැඩිදුර තොරතුරු 0252236760 යන දුරකථන අංකයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (පාලන) වෙතින් වැඩ කරන දිනයන් හි පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ලබා ගත හැකිය.

මීට අදාළ පූර්ව ලංසු රැස්වීම 2021.10.21 **දින පෙ.ව. 10.30** ට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන මන්දිර රැස්වීම් ශාලාවේ දී පැවැත්වේ.

**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,පුත්තලම් පාර, අනුරාධපුර.**

2021.10.06